Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date: 2012-12-12

පැමිණිලි පාර්ශවය : 01. පි.එම්.ඩී.එස්.එන්. වීරරත්න ඇතුළු පිරිස,
සංඥා උපදෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දෙමටගොඩ.

වගඋත්තර පාර්ශවය : 01. දුම්රිය සාමාන්‍යාධිකාරි,
දුම්රිය දෙපාර්තමේන්තුව,
මරදාන,
කොළඹ 10.

02. ප්‍රධාන ඉංජිනේරු (සංඥා),
ප්‍රධාන කාර්යාලය,
අංක : 417, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
දෙමටගොඩ,
කොළඹ 09.

<u>පැමිණිලි අංක : HRC/4446/12</u>

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරුවන් විසින් 2012.12.05 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුවන් 2001 වර්ෂයේ ඔක්තොම්බර් 01 වන දින සිට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවේ ස්ථිර පත්වීම් ලබා ඇති අතර, අවුරුදු 03කින් පසුව II ශ්‍රේණියේ තාක්ෂණ ශිල්පි සහායක තනතුර සඳහා උසස්වීම් ලැබිය



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.c
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

යුතු බවත්, එම උසස්වීම් ලැබීම සඳහා සියළු සුදුසුකම් තිබියදීත්, පැමිණිල්ල ඉදිරිපත් කරන ලද දින දක්වා එම උසස්වීම් නොලැබුණු බවත්ය.

පැමිණිල්ලේ වැඩිදුර කරුණු සැලකිරිම :-

1. පැමිණිලිකරුවන් පවසා සිටින පරිදි දුම්රිය සංඥා හා විදුලි සංදේශ උපදෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ තාක්ෂණ ශිල්පී සහායක පත්වීම් ලිපියේ සඳහන් නොවන පට්ටල්කරු, කම්බිකරු කම්මල්කරු, වඩුකරු, පින්තාරුකරු ආදි තනතුරුවල සේවාවන්හි යෙදෙන බව කියා සිටි. තවද එම අමතර සේවාවන්හි යෙදීම සඳහා ආවරණ දීමනා ලබාදි නැතත් ආවරණ ලිපි මගින් එම සේවාවන් මෙම පැමිණිලිකරුවන්ගෙන් ලබා ගත්තා බව වැඩිදුරටත් කියා සිටි. තවද එම සේවාවන්වල පුරප්පාඩු තිබියදී අදාළ උසස්වීම් ලබා නොදී ඉහත කී අයුරින් ආවරණ ලිපි මගින් මෙම පුරප්පාඩු සහිත තනතුරුවල සේවයේ යොදවන බව කියා සිටි.

2. තවද ඉහත පුරප්පාඩු සහිත තනතුරු වලට බාහිර පත්වීම් ලබාදී ඇති බැවින් පැමිණිලිකරුවන්ට එම පුරප්පාඩු සහිත සේවාවන් වලට අයදුම්කළ නොහැකි තත්වයක් ද ඇති කර ඇති බව ඔවුන් වැඩිදුරටත් පවසා ඇත.

3. 2013 වසරේ මානව හිමිකම් කොමිෂන් සභාවේ විභාග කළ පැමිණිල්ලේ ප්‍රතිඵලයක් ලෙස 2014 වසරේ දුම්රිය සාමාන්‍යාධිකාරිතුමාගේ විශේෂ නියෝගයක් මගින් තාක්ෂණ ශිල්පී සහායක II ශ්‍රේණියේ සීමිත තනතුරු කිහිපයකට උසස්වීම් ලබාදී ඇති අතර පැමිණිලිකරුවන්ට වසර 16ක අඛණ්ඩ සේවා කාලයක් තිබියද එම තනතුරෙන් ඉහළ තනතුරු වලට උසස්වීම් ලැබීමට වසර 05ක අඛණ්ඩ සේවාවක් අවශ්‍ය වන බැවින් එම උසස්වීම් මේ වන තුරු ලබා ගැනීමටද නොහැකි වී ඇත. තවද මෙම උසස්වීම් පැමිණිලිකරුවන්ට නොලැබීමට තවත් හේතුවක් ලෙස ඔවුන් දක්වන්නේ සංඥා දෙපාර්තමේන්තුවේ සංඥා හා විදුලි සංදේශ උපදෙපාර්තමේන්තුවේ උසස්වීම් පටිපාටිය නිසි අයුරින් සකස් වී නොතිබීම බව කියා සිටි.

වගඋත්තකරුවන්ගේ කරුණු සැලකිරිම :-

1. 2013.05.09 දිනැති ලිපියෙන් සහකාර සාමාන්‍යාධිකාරි (පාලන) කියා සිටින්නේ, තාක්ෂණ ශිල්පී II ශ්‍රේණියේ ඇති පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ කැඳවා ඇති අතර, මෙම ගොනුවේ ප්‍රධාන පැමිණිලිකරුවන් වන වීරරත්න මහතා ඇතුළු පිරිසක් එම සම්මුඛ පරීක්ෂණ ලැයිස්තුවට ඇතුලත් කර ඇති බවයි.

2. මෙම ගැටළුව ඇතිවීමට තවත් හේතුවක් ලෙස වගඋත්තරකරුවන් සඳහන් කර සිටින්නේ, සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවේ මූලික තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙන් වරින්වර කර ඇති සංශෝධන නිසා නිසියාකාර බඳවා ගැනීමේ පටිපාටියක් දුම්රිය දෙපාර්තමේන්තු සේවය සතුව තවමත් නොමැති බවයි.

3. තවද මෙම සංශෝධන නිසා එම කාලයට අදාළ සේවාවන් වෙනස් කර ඇති බැවින් හා/හෝ නැති කර ඇති බැවින් බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු නොමැති බව වගඋත්තරකරුවන් සඳහන් කරයි. මෙම හේතුව නිසා මෙම පැමිණිලිකරුවන්ට උසස්වීම් ලබාදීමේදී දැඩි වශයෙන් ප්‍රමාද වීම් ඇති බව වගඋත්තරකරුවන් පවසා සිටී.

4. මෙම පැමිණිලිකරුවන්ට අදාළ වන උසස්වීම් ලබා දීම මෙම දෙපාර්තමේන්තුවට අදාළ වන රෙගුලාසිවල නියම කර ඇති අතර, ඔවුන්ගේ නියමිත සේවා කාලය සම්පූර්ණ වූ විගස ඔවුනට එම උසස්වීම් හිමි විය යුතු බව දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටින ලද නිලධාරින් ද පවසා සිටින ලදී.

5. තවද ඔවුන් පවසා සිටින්නේ මෙම ගැටළුව විසදීමට සංඥා හා විදුලි සංදේශ උපදෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම නොව සමස්ත දුම්රිය දෙපාර්තමේන්තුව සතු බඳවා ගැනීමේ පටිපාටියම වෙනස් විය යුතු බවයි.

නිතිමය පදනම :-

1. 2004.04.11 අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ 5 (II) වගන්තිය ප්‍රකාරව III වන ශ්‍රේණියේ තාක්ෂණ ශිල්පී සහායක තනතුරේ වසර 03ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ඕනෑම අභ්‍යන්තර සේවකයකු IIශ්‍රේණියේ සහායක තනතුරකට උසස්වීමක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

2. 1999.03.26 සංශෝධිත අතිවිශේෂ ගැසට් අංක 1073/15 හි IIIවන උපලේඛනයේ සහ රෙගුලාසි 5.4 ප්‍රකාරව II වන ශ්‍රේණියේ ඕනෑම සහායක තනතුරක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන සේවකයන් II(බී) ශ්‍රේණියේ ඕනෑම තනතුරක් සඳහා සුදුසුකම් ලබයි.

3. 1999.03.26 සංශෝධිත අතිවිශේෂ ගැසට් අංක 1073/15 හි රෙගුලාසි 06 ප්‍රකාරව II (බී) ශ්‍රේණියේ ඔනෑම සහායක තනතුරක වසර 04ක සේවා කාලයක් සම්පූර්ණ කරන සේවකයන් II(ඒ) ශ්‍රේණියේ ඕනෑම තනතුරක් සඳහා සුදුසුකම් ලබයි.

4. 1999.03.26 සංශෝධිත අතිවිශේෂ ගැසට් අංක 1073/15 හි රෙගුලාසි 07 ප්‍රකාරව II (ඒ) ශ්‍රේණියේ ඕනෑම තනතුරක වසර 04ක සතුටුදායක සේවා කාලයක් ඇතුලත්ව වසර 05ක සම්පූර්ණ සේවා කාලයක් සහිත සේවකයකුට I ශ්‍රේණියේ ඕනෑම තනතුරක් සඳහා උසස්වීමට සුදුසුකම් ලබයි.

නිරීක්ෂණ =:

01. ඉහත සඳහන් කල කරුණු දැක්වීම් සහ නෛතික පදනම ප්‍රකාරව පැමිණිලිකරුවන් ඇතුළු එවැනි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන්ට විවිධ නිති රෙගුලාසි චක්‍රලේඛ හෝ එවැනි නෛතික ලියවිල්ලක් මගින් ලැබිය යුතු උසස්වීම් නියමිත කාලය තුළ නොලැබීමට හේතුව සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවේ සුදුසු අනුමත කල උසස්වීම් පටිපාටියක් නොමැති බවත්, අදාළ උපදෙපාර්තමේන්තුව තුළ සේවය කරන නිලධාරින් සංඛ්‍යාවට ප්‍රමාණවත් නිශ්චිත තනතුරු සංඛ්‍යාවක් නොතිබීම බව පෙනී යයි.

02. තවද සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවේ ඉහත පැමිණිලිකරුවන් ඇතුළු සේවකයින් ආවරණ ලිපි හෝ වෙනත් අනුමැතිය සහිත ලේඛන මගින් තමන්ගේ තනතුරට වඩා ඉහළ තනතුරු වල රාජකාරි වලට අනුයුක්ත කර ඇති බව නිරීක්ෂණය වේ. 2019 පෙබරවාරි 22 පැවැත්වුණු විමර්ශනයට පැමිණිලිකරුවන් හට ඔවුන් ඉල්ලා සිටින උසස්වීමට අදාලවන සුදුසුකම් සපුරා ඇති බව ඉදිරිපත් කරන ලද පුහුණු සහතික පත් මගින් සනාථ වන බව පෙනී යයි.

03. එම විමර්ශනයේදී වගඋත්තරකරු විසින් උසස්වීම් ලබා දීම අදාල තනතුරේ පවතින පුරප්පාඩු මත පදනම් වන බව කියා සිටියද, පුරප්පාඩු පිරවීම සඳහා අදාළ පුරප්පාඩු පවතින උප දෙපාර්තමේන්තුවේ හාහිරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනෙකුත් උපදෙපාර්තමේන්තු වලින්ද සේවකයන් අනුයුක්ත කළ හැකි බව වගඋත්තරකරු පිළිගෙන ඇත.

04. තවද ඉහත සඳහන් නිතිමය පදනමට අනුව 2001 වර්ෂයේ III ශ්‍රේණියේ සහායක තනතුරට බැඳුණු සේවකයෙකුට නිසි ආකාරව උසස්වීම් ලබා දුන්නේ නම් 2004/2005 වර්ෂයේ (වසර 03කට පසු) II ශ්‍රේණියේ සහායක තනතුරටද, 2010/2011 (වසර 05කට පසු) II (බී) ශ්‍රේණියටද, 2015/2016 (වසර 04කට පසු) II (ඒ) ශ්‍රේණියටද උසස්වීම් ලැබිය යුතුය. තවද 2021/2022 ( වසර 05කට පසු) I ශ්‍රේණියටද උසස්වීම් ලැබීමට හැකියාව ඇත.

05. තවද III ශ්‍රේණියේ සහකාර තනතුරු හොබවමින් සිටි සේවකයන් 2014 මාර්තු 12 II ශ්‍රේණියේ සහායකයන් වශයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරිගේ විශේෂ නිර්දේශයක් මත වසර 14ක සේවා කාලයකින් පසුව උසස් කිරීමක් ලබා දී ඇති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත නිරීක්ෂණ සහ අදාළ වන නෛතික තත්වය මත වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නිතිය ක්‍රියාත්මක කිරීම සර්ව සාධාරණ විය යුතුය යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(3) (ඇ) වගන්තිය යටතේ පහත සඳහන් නිර්දේශ නිකුත් කරනු ලැබේ.

i. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ (2014 වර්ෂයේ සිදුකළ පරිදි විශේෂ නිර්දේශයක් මගින් පැමිණිලිකරුවන්ට උසස්වීම් ලැබුණු ආකාරයට) විශේෂ අනුමැතියක් මගින් පැමිණිලිකරුවන් හට ඔවුනට ලැබීමට නියමිත ශ්‍රේණියේ තනතුරු වලට උසස්වීම් ලබා දීමටත්;

ii. තවද අදාළ උසස්වීම ලබාගැනීමට සුදුසුකම ලබන දිනයේ සිට වර්තමානය දක්වා හිමිවිය යුතු වැටුප් වර්ධක සහ හිඟ වැටුප් ලබා දීමටත්; වගඋත්තර පාර්ශවය පියවර ගත යුතුය.

2019.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද පැමිණිලිකරුටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණි මුත්තෙට්ටුවෙගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත : 01 ගරු අමාත්‍ය,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
07 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

02. ලේකම්,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
07 වන මහල සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

B/Nidarshani